# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/4/2025 (PSC)

බී.රොෂාන් ප්‍රනාන්දු

**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.03.04**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක එච්.එම්.ඊ.චන්ද්‍රසිරි මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ආර්.ඩබ්.ඩී.චතුරිකා මිය.

-**නියෝගය**-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

බී.රොෂාන් ප්‍රනාන්දු යන අය විසින්, 2025.01.02 දින ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු දැනට සේවයෙන් පහකර ඇති නිසා නැවත ඔහුව සේවයේ පිහිටුවන ලෙසටයි. අභියාචක සේවයෙන් පහකර ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති 2019.10.29 වෙනි දිනැති චෝදනා පත්‍රයට අදාළව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, එකී චෝදනා සියල්ලටම අභියාචක වැරදිකරු බවට පත්කර තිබීම හේතුවෙනි. එම කරුණ හේතුවෙන් ඔහු වෙත පනවා ඇති විනය දඩුවම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් නිකුත් කර ඇති 2023.11.20 දිනැති ලිපියේ සඳහන් කර ඇත. එම නියෝගයට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කරන බව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලද 2024.11.28 දිනැති ලිපියෙහි සඳහන් වේ.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා, 2019.10.29 දිනැති සෞඛ්‍ය, පෝෂණ සහ දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන)

විසින් නිකුත් කරන ලද 2024.06.29 දිනැති ලේඛනයේ සඳහන් වේ. එම ලේඛනයේ සඳහන් පරිදි, අභියාචකට විරුද්ධව චෝදනා 03ක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා පත්‍රයේ ප්‍රථම චෝදනා දෙක සඳහා පදනම් වී ඇත්තේ, රාජකාරියෙන් පිටත අවස්ථාවක දී අභියාචක, ඔහු සේවය කරන ලද රෝහල් භූමියට පැමිණ, එහි කණිෂ්ඨ සේවක කාමරය වෙත ගොස්, එම ස්ථානයේ සිටි එන්.ඩී.ඩබ්.ප්‍රියන්ත යන අයට අසභ්‍ය වචනයෙන් බැන වැදීමෙන් අනතුරුව, ඔහුට පහරදීමක් සම්බන්ධ කරුණකි.

ඉහත කී සිද්ධිය වන අවස්ථාවේ අභියාචක, ඔහුට නියමිත වැඩ මුරය අවසන් කර, රෝහලෙන් පිටව ගොස් නැවත ආපසු රෝහලට පැමිණීමෙන් පසු අවස්ථාවකදී, මෙම සිද්ධිය සිදුවී ඇති බව දෙපාර්ශවය විසින්ම හබ කිරීමකින් තොරව පිළිගෙන ඇත. සිද්ධිය වූ ස්ථානයේ සිටි එන්.පී.ඩබ්.ප්‍රියන්ත යන අය, අභියාචකට "**මහසෝනා**" යනුවෙන් ඇමතීම නිසා, අභියාචක විසින් ප්‍රියන්ත වෙත පහර දුන් බවට අභියාචක විසින් සඳහන් කර ඇත. ප්‍රියන්ත යන අය සාක්ෂි දීමට පැමිණ නැත. නමුත් ඔහු මූලික විමර්ශන අවස්ථාවේ දී ප්‍රකාශයක් ලබාදී ඇත. අශෝක රණරාජා බණ්ඩාර යන අය විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් වූ මූලික පරීක්ෂණය ඔහු විසින් පැවැත්වූ බවයි. ඔහු පවසා සිටියේ ප්‍රියන්ත යන අය විසින් කරන ලද පැමිණිල්ල වූයේ, රොෂාන් ජීවන්ත ප්‍රනාන්දු යන අය ඔහුට බැන වැදී, තර්ජනය කළ බවයි. එම සාක්ෂිකරු වන රණරාජා බණ්ඩාර අභියාචකගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔහු පවසා ඇත්තේ, ප්‍රියන්ත යන අයගෙන් අභියාචකට කරදර තිබූ නිසා, ඔහු ප්‍රියන්තට පහර දුන් බවයි. ඒ අනුව එම සාක්ෂිකරු පැහැදිලිව ප්‍රකාර කර ඇත්තේ, අභියාචක විසින් ප්‍රියන්ත යන අයට පහර දුන් බව ඔහු ඉදිරියේ පිළිගත් බවයි. මේ අවස්ථාවේ දී අභියාචකට නිහඬ වන ලෙසට ඔහු පවසා සිටියද, අභියාචක එම අවවාද පිළිනොගනිමින්, උස් හඬින් කෑගැසූ බවට එම සාක්ෂිකරු සාක්ෂි දී ඇත.

අනතුරුව සාක්ෂිදුන් චන්දන ප්‍රදීප් යන අය පවසා ඇත්තේ, අභියාචක ත්‍රීරෝද රථයක් පදවා ගෙන සෞඛ්‍ය කාර්ය සහායක පිරිමි විවේක කාමරය පැත්තට එනවා දුටු බවයි. චෝදනා ලැබූ සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂියක් ඉදිරිපත් කිරීමට ඔහු සමත් වී නැත. වජිර නිරංජීව බණ්ඩාර රණසිංහ යන සෞඛ්‍ය කාර්ය සහායක ප්‍රකාශ කර ඇත්තේ, ඔහු සහ ප්‍රියන්ත යන දෙදෙනා විවේක කාමරය තුළ සිටින විට, අභියාචක කාමරය තුළට ඇතුල් වී, "**උඹ මොනවද මට කියන්නේ මහසෝනා කිය කියා**" යනුවෙන් සඳහන් කර, ප්‍රියන්ත දෙසට බැන වදිනවා ඇසුන බවත්, අනතුරුව ප්‍රියන්තගේ කම්මුලට අභියාචක

විසින් අතින් පහරක් ගසනවා දුටු බවත් ය. එම සාක්ෂිය කිසිදු ආකාරයකින් බිඳ හෙළා නැත.

ප්‍රියන්ත නමැති පහර කෑමට ලක් වූ අය සාක්ෂියට කැඳවීමට කිහිප වරක් උත්සාහ ගෙන ඇති නමුත්, ඔහු වෙත යවන ලද නොතීසිය ආපසු ලැබී ඇති අතර, ඒවායෙහි හිමිකරු ලිපිනයේ නොමැති බවට සටහන් යොදා ඇත. ඒ අනුව ප්‍රියන්ත යන අය සාක්ෂියට කැඳවීමට කිහිප වරක් උත්සාහ ගෙන තිබුණද, එම උත්සාහය ව්‍යවර්ථ වී ඇත. කෙසේ වෙතත් ඉදිරිපත් වි ඇති සාක්ෂි වලින් ඉතාමත් පැහැදිලි අන්දමින් හෙළිදරව් වී ඇත්තේ, ප්‍රියන්ත යන අය සිටි විවේක කාමරයට අභියාචක පැමිණ, ඔහුට බැන වදිමින් පහර දී ඇති බවයි. එම සාක්ෂි නොපිළිගැනීමට කිසිදු හේතුවක් නැත. ඒ අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව මෙහි දී ලබා දී ඇති තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත.

අභියාචක වරදකරු බවට පත් කර ඇති චෝදනාව අනුව අභියාචක සේවයෙන් පහ කිරීමට තරම් ප්‍රමාණවත් වරදක් ඔහු විසින් සිදුකර තිබේද යන කරුණට ද අවධානය යොමු කරන ලදි. මෙම සිද්ධිය සිදුවන අවස්ථාවේ දී, අභියාචක සේවය නිම වී ගොස්, ආපසු සේවා ස්ථානයට පැමිණ චේතනාත්මකව ප්‍රියන්ත යන අයට පහර දුන් බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. එවැනි කරුණක් රෝහල් සේවකයෙකු වෙතින් බලාපොරොත්තු විය නොහැක. තවද මෙම අභියාචක 2011.04.15 දින ආදේශක සෞඛ්‍ය සේවා සහායකයෙකු ලෙස සේවයට එක්ව ඇති අතර, 2012.03.15 වෙනි දින සිට සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුරට පත්ව ඇත. ඒ අනුව මෙම සිද්ධිය වන විට අභියාචක සේවය කර ඇත්තේ වර්ෂ 07ක පමණ කාලයක් පමණි. එම කෙටි කාල පරිච්ඡේදය තුළදී, අභියාචක සේවයට නොපැමිණීම හේතුවෙන් ඔහු වෙත සේවය අත්හැරයාමේ නියෝගයක් ද 2016.05.04 දිනැතිව නිකුත් කර ඇත. එමගින් අභියාචක 2016.04.15 දින සිට සේවය අතහැර ගියා සේ සළකා ක්‍රියා කර ඇත. අනතුරුව ඔහු විසින් කරන ලද අභියාචකයක් හේතුවෙන් 2018.10.03 දිනැති ලිපිය මඟින් අභියාචක නැවත සේවයේ පිහිටුවා ඇත. ඒ අනුව ඉහත කී වර්ෂ 07ක මුළු සේවා කාලය තුළදී, වර්ෂ 02 වඩා වැඩි කාල පරිච්ඡේදයක් ඔහු සේවයේ නිරතව සිට නැත. එසේ පරීක්ෂා කර බැලීමේ දී අභියාචකගේ පෙර සේවයද යහපත් එකක් යැයි සැළකිය නොහැකිය.

එම හේතුව සළකා බලන විට අභියාචක වෙත නිකුත් කර ඇති දඬුවම ලිහිල් කිරීමට විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

ඉහත හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-